

# මාධ්‍යකලා විචාර ප්‍රතිචාර

.23
AN

ආචාර්ය සේන නානායක්කාර

350/2
99527 b.

# මාධ්‍යකලා විචාර ප්‍රතිචාර

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
## ආචාර්ය සේන නානායක්කාර
B.A. (Hons.), M.A. (Research), Ph.D. (Mass Comm.)
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

RAJMNLIB
99527

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 99527 |
| වර්ග අංකය | 302.23 NAN. |

සීමාසහිත
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

## ප්‍රභාෂණය

විශ්ව ජනමාධ්‍ය තාක්ෂණය අද වන විට මේ මහා මිනිස් සමාජය වසා පැතිර පවතින ආක්‍රමණශීලී විභවය කි. ඒ නිසාම එහි බලපෑම විවිධාකාරයෙන් හෙළිදරව් කෙරේ. විටෙක එය සෘජු ලෙස ම දක්නට ලැබෙන අතර තවත් විටෙක වක්‍රාකාරයෙන් පෙන්නුම් කෙරේ. තවත් ආකාරයකින් ගත්කල විටෙක එය ඉෂ්ට බලපෑමක් හෙවත් සමාජයට යහපත උදාකරන, සමාජය ප්‍රගමනය දක්වා යොමුකරවන්නක් බවට පත්වෙයි. එසේ නොවන කල එය අනිෂ්ට බලපෑමක් හෙවත් සමාජයට අයහපත උදාකරන, සමාජය අවගමනය කරා යොමුකරවන්නක් ද විය හැකි ය. කෙසේවෙතත්, මෙහි ප්‍රතිඵල විවිධාකාර ය. සංකීර්ණ ය. විටෙක අවබෝධ කරගත නොහැකි වන තරමට ම අවුල් සහගත ය.

නූතන විශ්ව ජනමාධ්‍ය තාක්ෂණය තුළ දැක්වෙන ප්‍රමුඛතම අනන්‍යතාව එය වෙයි. එය 21වන සියවසේ මානව වර්ගයා මුහුණදෙන සංකීර්ණතම සමාජ ගැටලුව බවට පත්වෙමින් පවතින්න කි. එමගින් අද මානව සමාජය කනබොන, අඳින පලඳින හෝ භාවිත කරන සියලු දේ තීරණය කරනු ලබන තත්ත්වයකට සියලු පසුබිම් සැකසී තිබේ. ඒ අනුව සමාජයේ දෛනික කටයුතු සැලසුම් කිරීම හා විවේකය, විනෝදය හා නිදහස භුක්ති විඳීමේ ක්‍රමවේදය ද ජනමාධ්‍ය විසින් තීරණය කරනු ලබන ස්වභාවයක් දක්නට ඇතැයි කීම අතිශයෝක්තියක් නොවේ. කොටින් ම කියතොත් එය සමාජයේ පැවැත්ම තීරණය කෙරෙන ප්‍රමුඛතම බලවේගය බවට පත්වෙමින් ඇත.

ශ්‍රී ලාංකේය ජනතාව වශයෙන් අද අප ද ප්‍රවේශ වෙමින් සිටින්නේ එබඳු ජනමාධ්‍ය තාක්ෂණ ජාලයක අන්තර් සම්බන්ධතා සහිත මානව සමාජ වපසරියකට ය. ඉදිරි අනාගතයේදී එහි බලපෑම

වඩාත් කටුක හෝ සුවපහසු විය හැකි ය. ඒ, අප විසින් එකී ජනමාධ්‍ය නිවැරදි ව අවබෝධ කරගනු ලබන ප්‍රමාණය අනුව විය හැකි ය. අවබෝධයෙන් සැලසුම් කරන, අවබෝධයෙන් මෙහෙයවන හා අවබෝධයෙන් භාවිත කරන මාධ්‍ය වූ කලී නිශ්චිතව ම සමාජය ප්‍රගමනය කරා තල්ලුකරවන්නක් වනු ඇතැ යි මම හඟිමි. මක් නිසාද යත්, යහපත් ජනමාධ්‍ය ජාලයක මුඛ්‍ය අධ්‍යාශය වනුයේ මානව සමාජයේ ඉදිරිගමන කෙරෙහි නිසි මංපෙත් විවර කිරීම බැවිනි.

නමුත්, අද අපට දක්නට ලැබෙන ජනමාධ්‍ය අත්දැකීම් එතරම් ම ප්‍රසන්න නොවන බව පෙනේ. හුදු ලාභය හා ප්‍රචාරණය ඒවායෙහි මුල් ශික්ෂාපද බවට පත්ව ඇති බැවිනි. එය සපුරා දේශපාලනික ය. මෙය වඩාත් නිවැරදි ව අවබෝධකොට නොගතහොත් තක්සේරු කරන්නට බැරි තරමට ම එහි ප්‍රතිඵලය භයානක වනු ඇතැයි යන්න මගේ දැඩි විශ්වාසය යි.

රටකට විවිධ දිශානතීන් ඔස්සේ විහිද යන පුළුල් ජනමාධ්‍ය විචාර සාහිත්‍යයක් අවශ්‍ය වනුයේ එබැවිනි. රූපවාහිනිය, ගුවන්විදුලිය හෝ සිනමාව ද, එසේත් නොවේ නම් පුවත්පත් කලාව ද, සෙසු මාධ්‍ය කලාවන් ද, වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ජීවිතය ඉගැන්වීමේ කලාව බවට පත්ව ඇත. එහෙයින්, කලාව, කලා කෘතීන් හා කලාකරුවන් අප දීර්ඝ වශයෙන් සම්භාවනාවට ලක් කළ යුතු ය. මාධ්‍ය කලාවන් යහපත් ඉසව් කරා ප්‍රවේශ කරවන්නට එකී සම්භාවනයන් බෙහෙවින් පිටුබල සපයයි.

"මාධ්‍යකලා විචාර ප්‍රතිචාර" කෘතියක් ලෙස සම්පාදනය කරන්නට මා පෙළඹවූයේ උක්ත සමාජ සන්දර්භය යි. රූපවාහිනිය, සිනමාව, ඡායාරූපය, නාට්‍යය හා කවිය, ගීතය ඇතුළත් ලේඛන සාහිත්‍යය ද අඩු වැඩි වශයෙන් ඊට ප්‍රස්තුත වෙයි. එදිනෙදා සමාජය තුළ සිදුවෙමින් පවත්නා විචල්‍යතාවන් හි සංකේතානුසාරී හරස්කඩක සංඥාවක් එමගින් හෙළිදරව් කෙරේ. කිසියම් සහෘදයෙකුගේ ජීවිතය අංශුමාත්‍රයකින් හෝ ආලෝකවත් කරන්නට එමගින් පිටුබල සැපයෙන්නේ නම්, එය මා දැරූ අහිංසක ප්‍රයත්නයෙහි අග්‍රඵල ලෙස සලකා නිහතමානී ව සතුටු වෙමි.

මේ කෘතිය සම්පාදනය කරන්නට මා හට ප්‍රබලතම උත්තේජනය වූයේ "ලක්බිම" පුවත්පතේ කර්තෘ මාණ්ඩලිකයකු වූ මහින්ද දළුගොඩආරච්චි සොයුරා යි. ප්‍රවීණ පුවත්පත් කලාවේදියෙකු මෙන්ම

සාහිත්‍යකාර සහෘදයෙකු ලෙස ඔහු මේ සඳහා ලබාදුන් පිටුබලය අනල්ප ය. දේශබන්දු සිරිසුමන ගොඩගේ මැතිඳුන් නොවන්නට මෙය මේ වන විට ත් හුදෙක් අපැහැදිලි අත්පිටපතක් ලෙසම පවතින්න කි. කැලණිය විශ්වවිද්‍යාලයේ නාට්‍ය හා රංගකලා සහ ප්‍රතිබිම්භකලා ඒකකයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර සොහොයුරාත්, කැලණිය පොල්හේන ශාන්තයාරාමාධිපති ශ්‍රී ලංකා අමරපුර චූලවංශ මහා නිකායේ අනුනායක ධූරන්ධර අතිපූජ්‍ය ගැවිලිපිටියේ පඤ්ඤාරංසි තිස්ස නායක හිමිපාණනුත්, නුගේගොඩ ශ්‍රී සුභද්‍රාරාම පිරිවෙන් විද්‍යායතනයේ පරිවේනාධිපති ශාස්ත්‍රපති පූජ්‍ය ගන්තුනේ සෝමතිලක හිමියනුත්, කොළඹ ගුණසිංහ මහවිදුහලේ නියෝජ්‍ය විදුහල්පති චන්ද්‍රසේන රංගොඩ සොහොයුරාත්, මෙම ග්‍රන්ථයේ පරිගණක අක්ෂර සංයෝජක හා පිටු සැලසුම් ශිල්පි "ලක්බිම" පුවත්පතේ පාලිත රණසිංහ සොහොයුරාත් පුණ්‍යානුමෝදනාවෙන් යුතුව සිහිපත් කළ යුතුයැයි හඟිමි.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය කේ.ඒ. නන්දසේන, පීඨාධිපති මහාචාර්ය ආරිය ලගමුව, අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තිස්ස වීරසේකර, සහකාර ලේඛකාධිකාරී ආර්. රමේෂ් යන මහත්වරුනුත්, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ කුමාර, දිලීප, උදයසිරි, සමන්, සුමුදු, ජීවනී, රසිකා, රේණුකා, හර්ෂණී, නිලන්ති හා මේ සඳහා බෙහෙවින් උපකාර කළ මනෝරි අබේගුණසේකර හා ලක්ෂිකා ඉරෝෂිණී යන උපකාරශීලී සමීපතමයනුත්, පරිගණක තාක්ෂණය පිළිබඳ කථිකාචාර්ය පී.එස්. පල්ලියගුරුගේ සොහොයුරා ප්‍රමුඛ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සියලු හිතවතුනුත්, මගේ ආදරණීය සුද්දිවත් මේ මොහොතේ කෘතගුණපූර්වක ව සෙනෙහසින් සමරමි.

සේන නානායක්කාර

## ප්‍රවිෂ්ටය


ප්‍රදානය 05

ප්‍රභාෂණය 07

ප්‍රවිෂ්ටය 09

ප්‍රථම භාගය - මාධ්‍ය විමසුම්

රූපවාහිනියේ ප්‍රචණ්ඩත්වය හා ළමා පරපුර 11
(රූපමාධ්‍ය හා ළමා මනස පිළිබඳ කාලානුරූප විග්‍රහයක්)

රූපණවේදය හා ටෙලිනාට්‍ය රංගනය 30
(රූපණය පිළිබඳ මාධ්‍ය විද්‍යානුකූල විමසුම)

ජනප්‍රිය සිනමාව සහ යථාර්ථවාදී සිනමාව 48
(හැත්තෑව දශකයේ චිත්‍රපට පිළිබඳ පසුවදනක්)

ඡායාරූපයෙහි සන්නිවේදනාත්මක සංලක්ෂණ 70
(ඡායාරූපකලා ව්‍යවහාරයේ යටිපෙළ කියවීමක්)

අතුල ලියනගේ හැදූ "බඹර වළල්ල" 91
(අමුඩයෙන් ඩෙනිමට - ජීවිතය විනිවිද දැකීම)

මා කියැවූ කැලණි සරසවි කුරුටු ගී 98
(චූල සම්ප්‍රදායක නොනිල හැඟීම් ප්‍රකාශනය)

ද්විතීය භාගය - මෙහෙවර සැමරුම්

ජයලත් මනෝරත්න 106
(විඩාපත් නොවූ අදීන තෙස්පියානුවා)

මහගමසේකර 113
(කවිකාර පරපුරේ හැබෑ ලාංකේය මුද්‍රාව)

ගාමිණී හත්තොටුවේගම 127
(විවෘත රංගයෙහි සොඳුරු ආඟාදායකයා)

ස්වර්ණ ශ්‍රී බණ්ඩාර 136
(දුහුනන් සොයා සෙවණදුන් රජරට වනස්පතිය)

පරාක්‍රම නිරිඇල්ල 153
(ජනතාවට "ජනකරළිය" හැදූ ජනකලාකරුවා)

තෘතීය භාගය - නාට්‍ය ඇගයුම්

උදයසිරි වික්‍රමරත්නගේ "සුද්දෙක් ඔබ අමතයි" 162

ප්‍රියංකර රත්නායකගේ "අද වගේ දවසක ඇන්ටිගනී" 170

ජයලත් මනෝරත්නගේ "බූරුවා මහත්තයා" 178